# ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු

# පළමු කාර්තුව 2020

## නිෂ්පාදන ප්‍රවේශය

## (පාද වර්ෂය 2010)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

**1.0 ආර්ථික පසුබිම**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 පළමු කාර්තුව (ජනවාරි, පෙබරවාරි, මාර්තු) සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශය අනුව පවත්නා මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත. කෝවිඩ්-19 වසංගතය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම හේතුවෙන් ආරම්භ වූ ලෝක ආර්ථිකය පසුබෑමේ ප්‍රවණතාවයත් සමග, 2020 පළමු කාර්තුවේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ද පසුබෑමට ලක්වූ අතර සේවා අංශය පමණක් සියයට 3.1ක ධන වර්ධන වේගයක් වාර්තා කරන අතරතුරදී ඉතිරි අංශ තුන වන කෘෂිකර්මය, කර්මාන්ත සහ භාණ්ඩ මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. සාමාන්‍ය වසරවලදී සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද උදාවීමට පෙර උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෙම කාර්තුවේ දී කෝවිඩ්-19 වසංගතය මර්ධනය කිරීම සඳහා ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් රට අකීය වීම හේතුවෙන් උපරිම මට්ටමින් ක්‍රියාත්මක වීමට නොහැකි වීමත් 2019 අප්‍රේල් මාසයේදී ඇතිවූ පාස්කු ප්‍රහාරය නිසා අඩපන වූ අංශවල වර්ධන අපේක්ෂාවන් යථා තත්ත්වයට පත් නොවීම ද මෙම කාර්තුවේ ආර්ථික පසුබෑමට තවදුරටත් දායක විය.

2020 වර්ෂය ආරම්භ වූයේ ගෝලීය කොවිඩ් 19 වසංගතය පෙරදිග ආසියානු රටවල්, යුරෝපය සහ ඇමෙරිකාව දැඩිව වෙළාගනිමින් පැතිර යන පසුබිමක සිටිමිනි. ශ්‍රී ලාංකීය සමාජය මුල් මාස දෙක තුළදී වෛරසයෙන් ඉහළ බලපෑමකට ලක් නොවූවත්, මාර්තු මුල සිට වෛරසය රට තුළ පැතිර යාම වේගවත් වූ අතර ඒ හේතුවෙන් මාර්තු මස මැද වන විට රට අගුළු දමන තත්ත්වයට පත් විය. සාපේක්ෂ වශයෙන් රටේ ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය යහපත් මට්ටමක පැවතියේ වුව ද ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රධාන වශයෙන් ම සංචාරක කර්මාන්තය, අපනයන සහ අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ හැකියාව මත රඳා පැවතීම හේතුවෙන් ගෝලීය වශයෙන් රටවල් අගුළුදැමීම් සහ සංචරණ සීමා පැනවීම නිසා මෙම වසංගතයේ ආර්ථික බලපෑමට ජනවාරි මස මුල සිට ම පාහේ ශ්‍රී ලංකා ආර්ථිකය ලක් වූයේ විශේෂයෙන් ම යුරෝපීය රටවලින් ලැබෙන අපනයන ඇනවුම් අඩු වීම, සංචාරක පැමිණීම අඩු වීම, අමුද්‍රව්‍ය ආනයනය සීමා වීම නිසා නිමැවුම් කර්මාන්ත කටයුතු අත්හිටුවීමට සිදුවීම යනාදියේ බලපෑමෙනි.

ගෝලීය වශයෙන් පැතිරීමට පටන් ගත් කොවිඩ් 19 ව්‍යසනය 2020 පළමු කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරනු ලැබ තිබේ. ඒ හේතුවෙන් පළමු කාර්තුවේ කර්මාන්ත ආර්ථික කටයුතු 2010 පදනම් වර්ෂය යටතේ මෙතෙක් වාර්තා කරන ලද විශාලතම පසුබැසීම 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී වාර්තා කර ඇත. එහි දී රෙදිපිළි හා ඇගළුම්, ඉදිකිරීම්, පතල් හා කැනීම්, පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන යනාදි කර්මාන්ත ආර්ථික කටයුතු ඉතා දැඩි පසුබැසීම් වාර්තා කර ඇති අතර නවාතැන්,ආහාර හා පාන වර්ග සැපයීම සේවා ආර්ථික කටයුත්ත ද දැඩි බලපෑමට ලක් වී ඇත.

ශ්‍රී ලංකා ආර්ථිකය 2019 වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව 2020 වර්ෂයේ පළමු කාර්තුවේ (ජනවාරි, පෙබරවාරි, මාර්තු) දී සියයට 1.6 කින් පසුබෑමට ලක් වී ඇත. මෙය 2010 පදනම් වර්ෂය යටතේ සකස් කෙරෙන ජාතික ගිණුම් ඇස්තමේන්තු වල දැනට වාර්තා වී ඇති විශාලතම පසුබෑසීම වේ. එහිදී 2020 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,845,900 ක් වු අතර ස්ථාවර මිල (2010) ගණන් යටතේ එහි අගය රුපියල් මිලියන 2,292,589 ක් විය. 2019 පළමු කාර්තුවේ දී මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 3,773,551 ක් සහ රුපියල් මිලියන 2,330,053 ක් වශයෙන් වාර්තා විය.

2020 පළමු කාර්තුවේ දී, ආර්ථිකයේ ප්‍රධාන සංරචක හතර වන කෘෂිකර්මය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකළ බදු පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 7.3 ක්, සියයට 28.4 ක්, සියයට 58.3 ක් සහ සියයට 6.0 ක් ලෙස වාර්තා වේ. (රූපසටහන 1)

තව ද 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු සියයට 5.6 ක පසුබෑමක් වාර්තා කර ඇති අතර කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 7.8 ක පසුබෑමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් සේවා ආර්ථික කටයුතු 2020 පළමු කාර්තුවේ දී සියයට 3.1 ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත.(රූපසටහන 2)

රූප සටහන **1**- දළ දේශීය නිෂ්පාදිතය සඳහා දායකත්වය




රූපසටහන **2** - පළමු කාර්තුවේ වර්ධන වේගයන් **(2019 සහ 2020)**




## කෘෂිකාර්මික අංශය

කෘෂිකාර්මික ආර්ථික කටයුතු සැලකීමේ දී 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී "වී හැර අනෙකුත් ධාන්‍ය වගා කිරීම(සියයට 12.9)", "පළතුරු වගා කිරීම(සියයට 7.4)", "එළවළු වගා කිරීම(සියයට 5.0)" සහ "වී වගා කිරීම (සියයට 4.1) යන ප්‍රධාන ආර්ථික ක්‍රියකාරකම් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. එසේ ම තවත් ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වන "තේ වගා කිරීම(සියයට -27.5)", "වන ද්‍රව්‍ය(සියයට -13.3)", "පොල් වගාව ඇතුළත් තෙල් සහිත බෝග වගාව(සියයට -12.8)", "රබර් වගා කිරීම(සියයට -8.7)", "කරදිය ධීවර කටයුතු(සියයට -8.1)" වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත. මෙහි දි කරදිය ධීවර කටයුතු කොවිඩ් වසංගතයේ සෘජු සහ වක්‍ර බලපැම්වලට ලක්වී ඇත.

## කර්මාන්ත අංශය

කර්මාන්ත ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 7.8ක පසුබැමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් එහිදී "මූලික ලෝහ හා ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදන(සියයට 8.2)", "ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම(සියයට 5.0)", "දැව හා දැවමය නිෂ්පාදන(සියයට 3.6)", "ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන(සියයට 2.8)", "විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම(සියයට 2.3) ", සහ "අපවහන පද්ධති(සියයට 1.8)" වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් "පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන(සියයට -19.2)", "පතල් හා කැනීම්(සියයට -18.3)", "ඉදිකිරීම් කර්මාන්ත කටයුතු(සියයට -16.0) ", "රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන(සියයට -13.6)", "රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන(සියයට -11.6)", "කඩදාසි නිෂ්පාදන(සියයට -7.7)", "අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන(සියයට -0.6)" යනාදි ප්‍රධාන කර්මාන්ත ආර්ථික ක්‍රියාකාරකම් 2020 පළමු කාර්තුවේ දී සෘණ වර්ධන වේගයන් වාර්තා කර තිබීම දැකිය හැකිය. මෙහි දී ඇගළුම් අපනයන සම්බන්ධයෙන් යුරෝපා කලාපයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ

ඉල්ලුම අඩු වීම බලපා ඇති අතර අමුද්‍රව්‍ය ආනයනය අඩු වීම බෝහෝ කර්මාන්ත ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.

**සේවා අංශය**

සේවා ආර්ථික ක්‍රියාකාරකම් සමස්තයක් වශයෙන් 2020 පළමු කාර්තුවේ දී සියයට 3.1ක සැලකිය යුතු ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. එහිදී "විදුලි සංදේශ සේවා(සියයට 15.2)", "තොරතුරු තාක්ෂණ සේවා(සියයට 9.6)", "මුල්‍ය හා මුල්‍ය අතරමැදි සේවා(සියයට 9.0)", "තැපැල් හා කුරියර් සේවා(සියයට 7.7)", "දේපළ වෙළදාම් (සියයට 4.2)", "තොග හා සිල්ලර වෙළදාම(සියයට 4.1)" යන සේවා ආර්ථික ක්‍රියාකාරකම් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදී "ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම(සියයට -6.2)" සහ "ප්‍රවාහනය(සියයට -0.1)" යන සේවා ආර්ථික ක්‍රියාකාරකම් ද්විත්වය පමණක් පසුබෑම් වාර්තා කර ඇත. විශේෂයෙන් ආහාර හා නවාතැන් පහසුකම් සැපයීම ආර්ථික කටයුත්තේ පසුබෑම කෙරෙහි සංචරණ සීමා පැනවීම නිසා සංචාරක කර්මාන්තයට සිදුවූ බලපෑම හේතුවී ඇත. මගීන් සහ භාණ්ඩ ප්‍රවාහනය සහ ගබඩා පහසුකම් සැපයීම සේවා ආර්ථික කටයුත්ත දළ දේශීය නිෂ්පාදිතයට සියයට 10.1ක පමණ දායකත්වයක් ලබා දෙන අතර එහි විශාල කොටසක් ආවරණය කෙරෙන ගොඩබිම් ප්‍රවාහනය රට අගුළු දැමීමත් සමග සම්පූර්ණයෙන් ම පාහේ අකර්මන්‍ය වීම සහ ගුවන් ප්‍රවාහනය සහ නාවුක ප්‍රවාහනය කොවිඩ් බලපෑමට ලක්වීම නිසා මෙම පසුබෑසීම වාර්තා වී ඇත. තව ද රක්ෂණය සේවා ආර්ථික කටයුත්ත සාමාන්‍යයෙන් ඉහළ වර්ධන වේගයක් වාර්තා කරනු ලැබූවත් මෙම කාර්තුවේ දී සියයට 0.2ක සුළු වර්ධන වේගයක් වාර්තා කර ඇත.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය 2020 පළමු කාර්තුවේ දී 167.8 ක් (2010=100) වන අතර 2019 පළමු කාර්තුවේ දී එය 162.0 ක් විය. ඒ අනුව 2019 පළමු කාර්තුවේ සිට 2020 පළමු කාර්තුව තෙක් දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 3.6 කි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) (2006/2007=100) 2020 පළමු කාර්තුවේ දී 225.3 ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2019 පළමු කාර්තුවේ දී 213.1 ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2019 පළමු කාර්තුවට සාපේක්ෂව 2020 පළමු කාර්තුවේ මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 5.8 කි.

## 1.1 කෘෂිකාර්මික ක්‍රියාකාරකම්

බෝහෝ කෘෂිකාර්මික බෝග වගාවන් යල සහ මහ වශයෙන් කන්න දෙකක් යටතේ වගා කෙරෙන අතර යල කන්නය සාමාන්‍යයෙන් මැයි සිට සැප්තැම්බර් දක්වාත්, මහ කන්නය සාමාන්‍යයෙන් ඔක්තෝම්බර් සිට අප්‍රේල් දක්වාත් දිවේ. ඒ අනුව මෙම බෝගයන්ගේ එකතු කළ වටිනාකම් කාර්තු අනුව ඇස්තමේන්තු කිරීමේ දී අදාල සම්බන්ධිත ආයතන විසින් ලබා දෙන අවසාන ඇස්තමේන්තු සේ ම යාවකාලික ඇස්තමේන්තු ද පදනම් කර ගනී.

"කෘෂිකර්මය,වනද්‍රව්‍ය සහ ධීවර කටයුතු" සමස්තයක් වශයෙන් 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 5.6 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇති අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 7.3 ක් වේ. පෙර වර්ෂයේ පළමු කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු වාර්තා කර තිබු වර්ධනය සියයට 5.0 ක් පමණ වේ. 2020 පළමු කාර්තුවේ දී කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු වාර්තා කර ඇති වර්ධන වේගයන් රූප සටහන 3 හි දැක්වේ.

රූප සටහන 3 - කෘෂිකාර්මික ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්, 2020 පළමු කාර්තුව




පෙර වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 19.8 ක පසුබැමක් වාර්තා කර තිබු "ධාන්‍ය වගා කිරීම (වී හැර)" උප ආර්ථික කටයුත්ත 2020 පළමු කාර්තුවේ දී සියයට 12.9 ක ධන වර්ධනයක් වාර්තා කර තිබීම කැපී පෙනේ. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බඩඉරිගු නිෂ්පාදනය සියයට 43.7 කින් ඉහළ යෑම බලපා ඇත. තව ද කව්පි, මුං ඇට සහ රට කජු නිෂ්පාදනයන් පිළිවෙලින් සියයට 39.8ක් ,සියයට 4.0ක් සහ සියයට 3.5 ක් වශයෙන් වැඩි වී ඇත.

'වී වගා කිරීම' උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2019 පළමු වැනි කාර්තුව සමග සැසඳීමේදී 2020 පළමු වැනි කාර්තුවේ දී සියයට 4.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2019/2020 මහ කන්නයේ වී නිෂ්පාදනය 2018/2019 මහා කන්නයේ නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 4.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. තවද මෙම කාලය තුල අස්වැන්න නෙලන ලද බිම් ප්‍රමාණයේ සියයට 1.9 ක වර්ධනයක් වාර්තා වී ඇත.

එළවළු වගා කිරීම උප ආර්ථික කටයුත්තේ මුර්ත දළ එකතුකළ අගය 2020 පළමු කාර්තුවේ දී 2019 වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව සියයට 5.0 ක වර්ධනයක් වාර්තා කර ඇත. පළමු කාර්තුවේ ඇස්තමේන්තු සඳහා පදනම් වන්නේ 2020/2019 මහ කන්නයේ ඇස්තමේන්තුගත අස්වැන්නයි. මෙම කන්නය ආරම්භයේ දී එනම් 2019 වසරේ අවසන් මාස කිහිපයේදී පැවති දැඩි වර්ෂාව සහිත කාලගුණික තත්ත්වය නිසා කන්නය ආරම්භ කිරීම තරමක් ප්‍රමාද විය. ඒ නිසා 2020 වර්ෂයේ පළමු මාසවලදී වෙළෙඳපොළට ලැබුණු එළවළු ප්‍රමාණය අඩුවීමෙන් මිල ගණන් ඉතා විශාල ලෙස වැඩිවිය.කෙසේ වෙතත් මාර්තු මාසයෙන් පසු සාමාන්‍ය පරිදි එළවළු වෙළෙඳපොළට ලැබීමත් සමග මිල ගණන් ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත්විය. මෙහිදී සමස්ත එළවළු නිෂ්පාදනය සඳහා සියයට 11 ක උපරිම දායකත්වයක් මඤ්ඤොක්කා නිෂ්පාදනයෙන් ලබාදී ඇත.

පොල් වගාව ප්‍රධාන කොට තැඹිලි ද ඇතුලත් "තෙල් සහිත පළතුරු වගා කිරීම" උප ආර්ථික කටයුත්ත 2020 පළමු කාර්තුවේ ස්ථාවර මිල ගණන් යටතේ වාර්තා කළ දළ එකතුකළ අගය රුපියල් මිලියන 14,909 ක් වේ. එමගින් පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට ලැබෙන දායකත්වය සියයට 0.7ක් වේ. 2019 පළමු කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දී මෙම උප ආර්ථික කටයුත්තේ සියයට 12.8ක් පසුබැස්මක් වාර්තා වී ඇත. 2019 පළමු කාර්තුවේ දී පොල් ගෙඩි දහස් 777,915ක් නිෂ්පාදනය කර තිබු අතර 2020 පළමු කාර්තුවේ දී එය පොල් ගෙඩි දහස් 679,310 දක්වා අඩු විය. එහිදී පොල් ගෙඩියක නිෂ්පාදකයාගේ සාමාන්‍ය මිල 2019 පළමු කාර්තුවට සාපේක්ෂව රුපියල් 35 සිට රුපියල් 45 දක්වා සියයට 28 කින් වැඩිවී ඇත. තව ද තැඹිලි අපනයනය සියයට 43 ක පසුබැස්මක් වාර්තා කර ඇත.

"තේ වගා කිරීම" ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2019 පළමු වැනි කාර්තුවේදී සියයට 1.2 ක පසුබැස්මක් වාර්තා වූ අතර එය තවදුරටත් 2020 පළමු වැනි කාර්තුවේ දී සියයට 27.5 ක පසුබැස්මක් වාර්තා කර ඇත. තේ වගාකරන ප්‍රදේශ වල පැවති අයහපත් කාලගුණික තත්වය නිසා 2019 පළමු වැනි කාර්තුව හා සැසඳීමේදී මෙම කාර්තුවේදී තේ නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 27.5 ක පසුබැස්මක් වාර්තාවී ඇත. කොළඹ වෙළඳපලේ තේ කිලෝවක සාමාන්‍ය මිළ, 2019 පළමු වැනි කාර්තුව හා සැසඳීමේදී රු. 585.83 සිට රු. 594.81 දක්වා සියයට 1.5 කින් වර්ධනයවී ඇත. තේ වෙළඳපොලේ සියයට 57.9 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහතරට තේ නිෂ්පාදනය සියයට 34.5 ක පසුබැස්මක් මෙම කාර්තුවේදී වාර්තා කර ඇත.

“රබර් වගාව” ආර්ථික කටයුත්තේ එකතු කළ අගය මෙන්ම රබර් නිෂ්පාදන ප්‍රමාණය 2020 පළමු කාර්තුවේදී සියයට 8.7 ක පසුබැස්මක් වාර්තාකර ඇති අතර එය 2019 පළමු කාර්තුවේදී සියයට 3.3ක වර්ධනයක් වාර්තාකර ඇත. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව , සකස්කළ රබර් කිලෝග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් ප්‍රමාණයෙහි සාමාන්‍ය මිළ රු.217.61 සිට රු.322.00 දක්වා සියයට 48.0 කින් 2020 පළමු කාර්තුවේදී වර්ධනයවී ඇත.

. ‘අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම’ උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොට්ට කිලංගු වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. මෙහි සමස්ත එකතුකළ අගය ස්ථාවර මිල ගණන් යටතේ 2020 පළමු කාර්තුව සඳහා රුපියල් මිලියන 3,870 ක් ලෙස වාර්තා වු අතර එය 2019 පළමු කාර්තුවට සියයට 4.3 ක පසුබැස්මකි.

‘සත්ත්ව නිෂ්පාදන’ ක්‍රියාකාරකම කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය, මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙමගින් 2020 පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය වෙත එකතු කළ අගය ස්ථාවර(2010) මිල ගණන් යටතේ රුපියල් මිලියන 15,629ක් ලෙස වාර්තා වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය සියයට 0.9ක් පමණ වේ. මෙම කාර්තුවේ දී සත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2019 වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව සියයට 0.4 ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත. මෙම කාර්තුව තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම හැර අනෙකුත් මස් පිණිස සතුන් ඇතිකරන සතුන් ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩුවීමක් වාර්තා කර ඇත. මෙම කාර්තුව තුළදී මස් පිණිස කුකුළන් ඇති කිරීම 12.8 කින් වර්ධනය වී ඇත. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුව වාර්තා කරන පරිදි මෙම අඩුවීමට, ගවයන් සඳහා වැළඳුන මුඛ හා කුර රෝගය සහ බස්නාහිර පළාත තුළ ඌරන් සඳහා වැළඳුන PRRS (Porcine Reproductive and Respiratory Syndrome) රෝගය ප්‍රධාන වශයෙන් හේතු විය. ගවයන් සඳහා වැළඳුන මෙම රෝගය හේතුවෙන් පැටවුන් බිහිවීම අඩුවීම නිසා රට තුළ සමස්ත කිරි නිෂ්පාදනය අඩුවීමට හේතු විය. 2020 පළමු කාර්තුව තුළදී බිත්තර නිෂ්පාදනයේ අඩු වීමක් වාර්තා කර ඇත. මේ වන විට රටට අවශ්‍ය ප්‍රමාණයට සරිලන බිත්තර නිෂ්පාදනයක් සිදු වන බැවින් බිත්තර මිල ස්ථාවරව පවත්වා ගැනීම සඳහා බිත්තර නිෂ්පාදකයින්ගේ සංගමය මගින් කරන ලද ඉල්ලීමට අනුව බිත්තර දමන කිකිළි පැටවුන් (layer birds) ආනනයන සීමා කර තිබීම මෙයට හේතු වී ඇත.

වන සම්පත් සහ දැව කඳන් නිෂ්පාදන ආර්ථික කටයුත්ත 2020 පළමු කාර්තුවේ දී සියයට 13.3 ක පසුබෑමක් වාර්තා කර ඇත. 2020 පළමු කාර්තුව සඳහා ස්ථාවර (2010) මිල ගණන් යටතේ මෙම ආර්ථික කටයුත්තෙහි එකතු කළ අගය වාර්තා වන්නේ රුපියල් මිලියන 11,914 ක් ලෙසිනි. එය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය සියයට 0.6ක් පමණ වේ. මෙම ආර්ථික කටයුතතේ අඩකට ආසන්න නිමැවුම් වටිනකම නියෝජනය වන්නේ දැව කඳන් නිෂ්පාදන වටිනාකමයි. මෙවර රාජ්‍ය දැව සංස්ථාව වෙත, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිදහස් කල යුතු දැව ඉඩම් ප්‍රමාණය අඩු වී ඇත. ඒ අනුව රාජ්‍ය දැව සංස්ථාවේ මෙවර දැව කඳන් නිමවුම සියයට 33.8 කින් පහත වැටී ඇත.

2020 පළමුවන කාර්තුවේදී කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්තෙන් දළ දේශිය නිෂ්පාදිතයට එකතුකරන වටිනාකම රුපියල් මිලියන 41,356ක් වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයට 1.0% ක දායකත්වය සපයයි. මෙම ආර්ථික කටයුත්ත 2020 පළමු කාර්තුවේදී 8.1% කින් පසු බැසිමකට ලක්වී තිබේ. 2019 පළමුවන කාර්තුවට සාපේක්ෂව වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය 4.6%කින් හා ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය 13.3% කින් අඩු වී තිබේ. මෙහිදී ප්‍රධාන අපනයන මත්ස්‍ය වර්ගවල මිළ සැලකිය යුතු පහලයෑමක් පෙන්නුම් කරයි. ධිවර හා ජලජ සම්පත් අමාත්‍යංශයේ වාර්තා වලට අනුව, ගෝලීය කොරෝනා තත්වය හේතුවෙන් විදේශයන් වෙත මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය, 2019 පළමුවන කාර්තුවට සාපේක්ෂව මෙම වසරේ පළමුවන කාර්තුවේදී 22.8%ක පසුබැමකට ලක්වී තිබේ. මිට අමතරව මෙම කල සිමාව තුළ පැවති අධික උෂ්ණත්වය හේතුවෙන් සාමාන්‍යයෙන් මසුන් පන්න කරනු ලබන ස්තරවලට වඩා පහතින් මසුන් ගැවසීමද මත්ස්‍ය නිෂ්පාදනය අඩුවීමට හේතුවක් ලෙස දක්වා තිබේ.

ධිවර හා ජලජ සම්පත් අමාත්‍යංශයේ වාර්තාවලට අනුව පෙර වසරේ අවසන් අර්ධය තුළ අධික වර්ෂාව හේතුවෙන් නිත්‍ය ජලාශ බොහොමයක් පිටාර මට්ටම වෙත ලගා වී තිබීම හේතුවෙන් පන්න කිරීම් වලදී ලැබෙන මත්ස්‍ය අස්වැන්නේ අඩුවීම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය අඩුවීම කෙරෙහි හේතු වී තිබේ.

### 1.2 කර්මාන්ත ක්‍රියාකාරකම්

කර්මාන්ත ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 28.4 ක දායකත්වයක් ලබා දෙන අතර වාර්තා කර ඇති පසුබැම සියයට 7.8 කි.

කර්මාන්ත ආර්ථික කටයුතු සම්බන්ධයෙන් සැලකූ විට අප්‍රේල් මස අවුරුදු නිවාඩු ලබා දීමට පෙරොතුව එළඹෙන ඉහළ තිව්රතාවයකින් ආර්ථික කටයුතු සිදුවන මාර්තු මාසයේ අග සති දෙකක පමණ කාලය රට අගුළු දමා පැවතීම ඉතා දැඩි බලපෑමක් ඇති කර තිබේ. එසේ ම ආනයන අපනයන වටිනාකම් තුළින් පැහැදිලි වන පරිදි ඇමෙරිකා එක්සත් ජනපදයෙන් සහ යුරෝපා කලාපයෙන් ලැබෙන ඇණවුම් අඩු වීම, චිනයෙන් කෙරෙනු ලබන අමුද්‍රව්‍ය ආනයනය කිරීම් අඩු වීම තුළින් කර්මාන්ත ක්ෂේත්‍රයේ සිදුවී ඇති අඩාල වීම පිළිඹිබු වේ. 2020 පළමු කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු වාර්තා කර ඇති වර්ධන වේගයන් රූප සටහන 4 හි දැක්වේ.

**රූප සටහන 4 - කර්මාන්ත ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්, 2020 පළමු කාර්තුව**




දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.2 ක් නියෝජනය කරන පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත, 2019 ප්‍රථම කාර්තුවට සාපේක්ෂව 2020 ප්‍රථම කාර්තුවේ දී සියයට 18.3 ක සෘණ වර්ධන අනුපාතයක් වාර්තා කර ඇත. පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත උප ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් 3 ක් වන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම්, මැණික් කැනීම් හා අනෙකුත් අමුද්‍රව්‍ය කැනීම් වලින් සමන්විත වේ. සමස්ත පතල් හා කැනීම් ආර්ථික කටයුත්ත සඳහා මෙම ආර්ථික කටයුතු 3 අතරින් ඉහළම එකතු කළ වටිනාකමක් ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැනීම් ආර්ථික කටයුත්තෙන් ලැබේ. ඉදිකිරීම් කර්මාන්තයේ පසු බැසීම පතල් හා කැනීම් අංශයේ සෘණ වර්ධන අනුපාතයක් වාර්තා වීමට සෘජුවම බලපා ඇත. තවද ශ්‍රී ලංකා මැණික් අපනයනය සහ අනෙකුත් අමුද්‍රව්‍ය කැනීම් කටයුතු වලද පසු බැස්මක් දැකිය හැක.

### 1.2.1 නිමැවුම් කර්මාන්ත කටයුතු

සමස්ථ නිෂ්පාදන කර්මාන්ත අංශය 2020 පළමු කාර්තුවෙහිදී දළ දේශීය නිෂ්පාදිතයට ස්ථාවර මිල (2010) අනුව රුපියල් මිලියන 440,618 ක් එකතු කර ඇත. 'ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය' උප අංශය 2019 පළමු කාර්තුවේදී සියයට 2.1 ක වර්ධන වේගයක් වාර්තා කළ අතර 2020 පළමු කාර්තුවේදී එය තවදුරටත් සියයට 2.8 වර්ධන වේගයක් වාර්තා කර ඇත. 2019 පළමු කාර්තුවට සාපේක්ෂව 2020 පළමු කාර්තුවේදී ආහාර නිෂ්පාදනයේ නිමැවුම් වටිනාකම සියයට 7.7 කින් ද දුම්කොළ නිෂ්පාදනයේ නිමැවුම් වටිනාකම සියයට 10.9 කින් ද ඉහල ගොස් ඇති අතර බීම නිෂ්පාදනයේ නිමැවුම් වටිනාකම සියයට 4.4 කින් අඩුවී ඇත.

‘රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ හා බුමුතුරුණු නිෂ්පාදනය’ උප ආර්ථික කටයුත්ත 2019 පළමු කාර්තුවේදී සියයට 3.9 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. එය 2020 පළමු කාර්තුවේදී සියයට 13.6 පසුබෑමක් වාර්තා කර ඇත. 2020 පළමු කාර්තුවේදී රෙදිපිළි අපනයන ප්‍රමාණය සියයට 14.8 කින් අඩු වී ඇති අතර ඇඟලුම් අපනයන ප්‍රමාණය සියයට 21.1 කින් අඩු වී ඇත.

2020 පළමු කාර්තුවේදී ‘ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදනය’ උප ක්‍රියාකාරකමෙහි වර්ධන වේගය සියයට 3.6 ක් ලෙස වාර්තා වී ඇත. 2020 පළමු කාර්තුව තුළ මෙම ක්‍රියාකාරකම්වල නිමැවුම් වටිනාකම සියයට 5.8 කින් ඉහළ ගොස් තිබේ.

‘අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන’ උප අංශය 2019 පළමු කාර්තුවේදී සියයට 94.8 ක සැලකිය යුතු ඉහළ වර්ධන වේගයක් වාර්තා කර තිබූ අතර, 2020 මුල් කාර්තුවේදී සියයට 19.2 ක පහත වැටීමක් වාර්තා කර ඇත. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමාණය සියයට 19.0 කින් අඩු වී තිබේ.

‘ගෘහ භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය’ 2019 පළමු කාර්තුවේදී සියයට 5.9 ක වර්ධන වේගයක් වාර්තා කර තිබූ අතර 2020 පළමු කාර්තුවේදී සියයට 6.7 ක පසුබෑමක් වාර්තා කර ඇත. මෙම කටයුත්තේ නිමැවුම් වටිනාකම 2020 පළමු කාර්තුවේදී සියයට 4.5 කින් පහළ වැටී ඇත.

2019 පළමු කාර්තුව හා සසඳන විට 2020 පළමු කාර්තුවේදී ‘මූලික ලෝහ සහ ලෝහ ආශ්‍රිත නිෂ්පාදන’ සියයට 8.2 කින් ඉහළ ගොස් තිබේ. මූලික ලෝහවල නිමැවුම් වටිනාකම සියයට 8.9 කින් ඉහළ ගොස් ඇති අතර පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදිතය සියයට 7.9 කින් ඉහළ ගොස් තිබේ.

### 1.2.2 අනෙකුත් කර්මාන්ත ආර්ථික කටයුතු

“විදුලිය නිෂ්පාදනය” කර්මාන්තයෙහි මූර්ත එකතු කළ අගය 2020 වර්ෂයේ පළවන කාර්තුවේ දී සියයට 2.3 කින් ඉහළ ගොස් ඇත. එය 2019 වර්ෂයේ පළවන කාර්තුවේදී සියයට 1.9 ක ඉහළ යාමක් වාර්තා කොට තිබිණි. අදාළ කාලපරිච්ඡේදය තුළ මුළු විදුලිබල ජනනය ගිගාවොට් 3,887 සිට ගිගාවොට් 3,947 දක්වා සියයට 1.5 කින් වැඩි විය. එසේම මෙම කාර්තුව තුල දී සමස්ත විදුලිබල ජනනයෙන් ජල විදුලිබල ජනනය සහ තාප විදුලිබල,පුනර්ජනනීය විදුලිබල ජනනය අතර අනුපාතය 23:77 ලෙස සටහන් විය. කෙසේ වෙතත් 2020 වර්ෂයේ පළමුවන කාර්තුවේදී විදුලිබල විකුණුම් ආදායම සියයට 3.1 ක පහළ යාමක් වාර්තා වී ඇත.

2020 වර්ෂයේ පළවන කාර්තුවේදී “ජලය එක්රැස් කිරීම,පිරිසිදු කිරීම සහ බෙදාහැරීම” යන ආර්ථික කටයුත්තේ මූර්ත දළ එකතුකළ වටිනාකම සියයට 5.0 ක වර්ධනයක් වාර්තා කර ඇත. ජලය සැපයුම් ප්‍රමාණය 2019 වර්ෂයේ පළමුවන කාර්තුවේ පැවති ඝන මීටර දහස් 182,645 සිට මේ කාර්තුවේ ඝන මීටර දහස් 191,742 දක්වා සියයට 5.0 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම මෙහි අලෙවි ආදායම සියයට 4.7 කින් පහළ ගොස් ඇත.

කර්මාන්ත ආර්ථික කටයුතු අතරින් 2020 පළමු  කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 6.4 ක් වූ දායකත්වයක් සහිත "ඉදිකිරීම් කර්මාන්තය"  2019 පළමු  කාර්තුව හා සංසන්දනයේදී 2020 පළමු කාර්තුවේදි සියයට 16.0 ක පසුබෑමක් වාර්තා කර ඇත. මෙම කාර්තුව තුලදී සමස්ත සිමෙන්ති සැපයුම සියයට 16.4 කින් අඩුවී ඇත. එහිදී සිමෙන්ති ආනයනය සියයට 27.4 කින් අඩුවි ඇති අතර දේශීය නිෂ්පාදනය සියයට 0.56 ක සුළු ඉහළ යාමක් වාර්තා කර ඇත. ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වටිනාකම්ද සියයට 20.4 කින් අඩුවී ඇත.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක මහා පරිමාණ ඉදිකිරිම් බොහොමයක් චීන සමාගම් විසින් සිදුකරන අතර (වරාය නගරයේ ඉදිකිරිම්ද ඇතුළුව) එහි සේවක පිරිසෙන් බහුතරයක් චීනජාතිකයන් වේ. 2019 දෙසැම්බර් මස පමණ චීනයේ ඇතිවු කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිවාඩු සඳහා තම මව්රටට ගොස් සිටි චීන කම්කරුවන්ට යලිත් ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකි විය. එසේම මෙටර සිටි චීන කම්කරුවන් සමග එක්ව කටයුතු කිරිමට ශ්‍රී ලාංකික කම්කරුවන් කැමැත්තක් නොදැක්වීය. එසේ ඇතිවූ මහා පරිමාණ ඉදිකිරිම් කර්මාන්තයේ කම්කරු අර්බුදය ද ඉදිකිරිම් ක්ෂේත්‍රයේ පසුබෑමට බලපා ඇත.

### 1.3 සේවා  ක්‍රියාකාරකම්

පවත්නා මිල ගණන් යටතේ ගණනය කෙරෙන දළ දේශීය නිෂ්පාදිතයට 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 58.3ක දායකත්වයක් ලබාදෙන සේවා ආර්ථික කටයුතු සියයට 3.1 ක සැලකිය යුතු වර්ධන වේගයක් වාර්තා කර තිබේ. 2020 පළමු කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු වාර්තා කර ඇති වර්ධන වේගයන් රූප සටහන 5 හි දැක්වේ.

**රූප සටහන 5 - සේවා ක්‍රියාකාරකම් හී වර්ධන අනුපාතිකයන්, 2020 පළමු කාර්තුව**




"තොග සහ සිල්ලර වෙළදාම" 2020 පළමු කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 11.6ක දායකත්වයක් ලබා දී ඇති අතර 2019 පළමු කාර්තුවේ වාර්තාවූ සියයට 4.6 ක වර්ධනය හා සැසදීමේදී 2020 පළමු කාර්තුවේදී ද සියයට 4.1 ක වර්ධනයක් වාර්තා කර ඇත.

සමස්ත ආනයනවල උච්චාවචනයන් සහ සමස්ත දේශීය නිෂ්පාදනයේ බලපෑම තොග හා සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම්හි අගය එකතු කිරීම සඳහා බලපායි. එබැවින් මෙම ක්‍රියාකාරකම්වල වර්ධන වේගය රඳා පවතින්නේ ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන ඉහත විචල්‍යයන් තුනෙහි විචලනයන් මත ය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වලට අනුව මුළු ආනයන වියදම 2019 පළමු කාර්තුවේ වාර්තා වූ රුපියල් මිලියන 866,034 ට සාපේක්ෂව මෙම කාර්තුවේ දී රුපියල් මිලියන 821,457 දක්වා සියයට 5.1 කින් අඩුවී ඇත. කෙසේ වෙතත් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම් අගය රුපියල් මිලියන 163,966 සිට රුපියල් මිලියන 176,285 දක්වා සියයට 7.5ක වැඩිවීමක් මෙම කාර්තුවේදී පෙන්වා ඇත. තවද ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළෙඳ දර්ශක වලට අනුව පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය මෙම කාර්තුවේ දී සියයට 5.7 කින් වැඩිවී ඇත. 2019 පළමු කාර්තුවේ අගයන් හා සසඳන විට 2020 පළමු කාර්තුවේදී සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 1.1 කින් අඩු වී තිබේ. කෙසේ වෙතත්, දේශීය කාර්මික නිෂ්පාදනයේ සමස්ත වෙළඳ ආන්තික වටිනාකම 2019 පළමු කාර්තුව හා සසඳන විට 2020 පළමු කාර්තුවේදී සියයට 2.0 කින් පහළ ගොස් ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ හි බාහිර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2019 පළමු කාර්තුව හා සසඳන විට 2020 පළමු කාර්තුවේදී ලෝකයේ සෙසු රටවල් සඳහා වන මුළු අපනයන වටිනාකම සැලකිය යුතු ලෙස සියයට 14.8 කින් අඩු වී තිබේ. මහ බැංකු වෙළඳ දර්ශකවලට අනුව සමස්ත අපනයන පරිමාව දර්ශකය සියයට 16.4 කින් කැපී පෙනෙන ලෙස අඩු වී තිබේ. අපනයන අතර, කාර්මික අපනයනවල පරිමා දර්ශකය සහ කෘෂිකාර්මික අපනයන මෙම කාර්තුවේදී පිළිවෙලින් සියයට 20.0 කින් සහ සියයට 15.6 කින් අඩුවී ඇති අතර එය ශ්‍රී ලංකාවේ අපනයන කෙරෙහි කෝවිඩ් -19 වසංගතයේ අහිතකර බලපෑම පෙන්නුම් කරයි.

"මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම" යන ආර්ථික ක්‍රියාකාරකම, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් උප කාර්යයන් ගෙන් සමන්විත වේ. "මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම" යන ක්‍රියාකාරකම, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප කාර්යයන් ගෙන් සමන්විත වේ. මෙම ක්‍රියාකාරකම 2019 පළමුවන කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දී සියයට 0.1 ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. ගුවන් සේවා වාර්තා අනුව මෙම කාර්තුවේ ආදායම සියයට 22.8 කින් පහළ ගොස් ඇත. 2020 පළමුවන කාර්තුවේදී මුහුදු මාර්ග ප්‍රවාහන සේවාවන් හී ආදායම සියයට 7.2 කින් වැඩි වී ඇත. ගබඩා කිරීම් ඇතුලත් ප්‍රවාහනය සඳහා පහසුකම් සැපයීමේ සේවාවන්හි ආදායම සියයට 12.7 කින් පහළ ගොස් ඇත.

පසුගිය වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේදී ද්විත්ව කාර්ය වාහන ලියාපදිංචිය 18.8කින් ඉහළ ගොස් ඇත. බස් රථ, ලොරි රථ, මෝටර් වාහන , ත්‍රීරෝද රථ හා ඉඩම් වාහන ලියාපදිංචිය පිළිවෙලින් සියයට 26.4ක්, සියයට 34.4ක්, 23.1ක් , 26.5ක් හා 45.5ක් ලෙස පහළ ගොස් ඇත. දුම්රිය දෙපාර්තුමේන්තුවේ ආදායම සියයට 18.8ක පහළ යාමක් වාර්තා කරන අතර ධාවනය වූ කිලෝමීටර් සංඛ්‍යාව සියයට 23.3 ක අඩුවීමක් ද වාර්තා කරයි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙහි ආදායම සියයට 11.8 කින් අඩු වී ඇත. එම ප්‍රවාහන සේවාවෙහි මගී කිලෝමීටර් සංඛ්‍යාව සියයට 13.0 ක සෘණාත්මක වර්ධනයක් ද වාර්තා කරයි. ශ්‍රී ලංකා ගුවන් සේවා ආදායම මෙම කාර්තුවේදී සියයට 15.4ක පසුබෑමක් පෙන්වන අතර එම ප්‍රවාහන සේවාවෙහි මගී කිලෝමීටර් සංඛ්‍යාවද සියයට 19.3 ක අඩුවීමක් වාර්තා කර ඇත. දෙපාර්තමේන්තුව මගින් ගණනය කරනු ලබන NCPI ප්‍රවාහන දර්ශකය ද 3.7 ක ඉහල යාමක් වාර්තා කරයි.

තැපැල් හා කූරියර් සේවා" ආර්ථික කටයුත්ත සැලකීමේදී, 2019 පළමු කාර්තුවට සාපේක්ෂව 2020 පළමු කාර්තුවේ වර්ධනය සියයට 7.7කි. තැපැල් දෙපාර්තමේන්තුවේ දත්ත වාර්තා අනුව, පසුගිය කාර්තුව හා සැසඳීමේදී මෙම කාර්තුවේ දී දෙපාර්තමේන්තුවේ සමස්ත සේවක පිරිවැය සියයට 9 කින් පමණ වැඩි වී ඇති අතර මුළු වියදම සියයට 6 කින් වැඩි වී ඇත.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය 2019 දෙවන කාර්තුවේ සිටම පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් අහිතකර බලපෑමට ලක්විය. එහි බලපෑම ක්‍රමයෙන් අඩු වෙමින් පැවතියදී කෝවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් නැවත වතාවක් මෙම ක්ෂේත්‍රෙය් කඩාවැටීමක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 පළමු කාර්තුවේ නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම ආර්ථික කටයුත්තේ දළ එකතුකළ වටිනාකම සියයට 6.2 කින් අඩු වී තිබේ. 2019 පළමු කාර්තුව සමග සැසඳීමේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDM) වාර්තාවලට අනුව ජාත්‍යන්තර සංචාරක පැමිණීම 2020 ජනවාරි මාසයේ සිටම අඩුවීමක් දැකිය හැකිය. සංචාරක පැමිණීම 2019 වර්ෂයට සාපේක්ෂව ජනවාරි මාසයේ සියයට 6.5කින් ද පෙබරවාරි මාසයේ සියයට 17.7කින් ද මාර්තු මාසයේ සියයට 70.8කින් ද අඩු වී ඇත. කොරෝනා වෛරසය ගෝලීය වසංගතයක් ලෙස ව්‍යාප්ත වීමත් සමග ශ්‍රී ලංකා රජය මගී ගුවන් යානා ලංකාවට පැමිණීම සීමා කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) වාර්තාවලට අනුව, වර්ගීකරණය කරන ලද හා වර්ගීකරණය නොකළ නවාතැන් පහසුකම් සපයන , සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි

ආයතනවල 2019 වර්ෂයේ පළමු කාර්තුවේ කාමර භාවිත අනුපාතය 76.3ක් වන අතර, මෙම කාර්තුවේ එම අගය 52.0 ක් වේ.

"වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම" යන සේවා ආර්ථික කාර්යය සියයට 4.5 ධන වර්ධනයක් 2019 පළමු කාර්තුවට සාපේක්ෂව 2020 පළමු කාර්තුවේ වාර්තා කර ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ ඇතුලත් ආර්ථික ක්‍රියාකාරකම් අතුරින් 2020 පළමු කාර්තුවේ දී සියයට 15.2 ක් වූ වැඩි ම වර්ධන වේගය "විදුලි සංදේශ සේවා" උප ආර්ථික කටයුත්ත වාර්තා කර ඇත. එසේ ම මෙම කටයුත්තේ පවත්නා මිල ගණන් යටතේ දළ එකතුකළ අගය සියයට 13.0න් වැඩි වී ඇත. මෙමගින් දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය සියයට 0.6ක් පමණ වන අතර වටිනාකම මිලියන 23,993ක් පමණ වේ. විදුලි සංදේශන සේවා ආර්ථික කටයුත්තේ වර්ධනය සැලකූ විට මොබයිල් බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා සියයට 19.4 ක වැඩිවීමක් සහ ස්ථාවර බ්‍රෝඩ්බෑන්ඩ් සම්බන්ධතා සියයට 6.5 ක වැඩිවීමක් වාර්තා කර ඇත.

"පරිගනක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්" යන උප ක්‍රියාකාරකම 2020 වර්ෂයේ පළමුවන කාර්තුවේදී සියයට 9.6 ක වර්ධනයක් වාර්තා කර තිබීම කැපී පෙනේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් තුලන දර්ශකයන්ට අනුව පරිගණක සේවා අපනයන ආදායම සියයට 5.5ක වර්ධනයක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

මුල්‍ය සේවා සැපයීම ආර්ථික කටයුත්ත සඳහා දත්ත ලබා ගන්නා ප්‍රධාන මුලාශ්‍ර වන්නේ ,බලපත්‍රලාභී වාණිජ බැංකු (LCB), බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSB), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම් (RFC), ශ්‍රී ලංකා මහ බැංකුව(CBSL), කොළඹ කොටස් හුවමාරුව (CSE) සහ ශ්‍රී ලංකාවේ ගෘහ අංශය නියෝජනය කරන පුද්ගලයින් විසින් කරගෙන යනු ලබන මූල්‍ය ක්‍රියාකාරකම් ය. මුල්‍ය සේවා සැපයීම යන ආර්ථික කටයුත්තේ 2020 පළමු කාර්තුව සඳහා වර්ධනය සියයට 9.0 ක් ලෙස වාර්තා වන අතර එහි මුර්ත දළ එකතුකළ අගය රුපියල් මිලියන 152,822 ක් විය. මෙම වටිනාකම 2019 පළමු කාර්තුවේ දී වාර්තා වූයේ රුපියල් මිලියන 140,166ක් වශයෙනි. එමෙන්ම මෙම කාර්තුවේදී ණය, අත්තිකාරම් සියයට 11.4 කින් හා තැන්පතු වල වටිනාකම සහ සියයට 12.2 කින් ඉහළ ගොස් තිබේ. තවද 2020 පළමු කාර්තුවේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද භරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය(AWLR) සහ භරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය(AWDR) පිලිවෙලින් සියයට 13.2 ක් සහ සියයට 7.9 ක් වාර්තා වී ඇත.

"රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ" කටයුතු වල මුර්ත එකතුකළ අගය 2019 පළමු කාර්තුවේදී සියයට 7.4ක වර්ධනයක් වාර්තා කර ඇති අතර, එය තවදුරටත් 2020 පළමු කාර්තුවේදී සියයට 0.2 කින් වර්ධනය වී ඇත. මෙම කාලයේදී රක්ෂණ සමාගම් වල සේවක ගෙවීම් සහ බදු පෙර ලාභයෙහි සියයට 2.5 ක වර්ධනයක් වාර්තාවී ඇත. රක්ෂණ සේවාව භාවිතය මැන දක්වන උපයන ලද රක්ෂණ වාරික වටිනාකම හා උපයන ලද හිමිකම් වටිනාකමෙහි එකතුව මෙම කාර්තුවේ දී

සියයට 0.3 කින් පහළ වැටී ඇත. ඒ සඳහා සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ උපයන ලද හිමිකම් වටිනාකම සියයට 11.3 කින් පහළයාම ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

දේපළ වෙළඳාම් කාර්යයන් ( නිවාස අයිතිය ඇතුළත්ව) 2019 පළමුවන කාර්තුවට සාපේක්ෂව 2020 පළමුවන කාර්තුවේදී සියයට 4.2 ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ආර්ථික කටයුත්තේ ස්ථාවර මිළ යටතේ දළ එකතු කළ අගය රුපියල් මිලියන 151,068 ක් වන අතර එය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 6.2 ක දායකත්වයක් පෙන්නුම් කරයි.

"වෘත්තීය සේවා" 2019 පළමු කාර්තුවට සාපේක්ෂව 2020 පළමු කාර්තුවේ දී සියයට 1.6ක වර්ධනයක් වාර්තා කර තිබේ. මෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8 ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් " නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහ නිර්මාන හා ඉංජිනේරු කාර්යයන්", " විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්" "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන්" සහ "ප්‍රකාශන කාර්යයන්", "පශු වෛද්‍ය කාර්යයන්". "කුලී හා බදු කාර්යයන්", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශණ කාර්යයන්" සහ "ගොඩනැගීම් හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් කාර්යයන්" ගෙන් සමන්විත වේ. ඉහත දැක්වෙන කාර්යයන් සඳහා නිමවුම් අගය ගණනය කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන වැට් දත්ත පදනම් කරගෙන වේ.

"කලා හා පොදු විනෝදාත්මක කාර්යයන්" සහ "අනෙකුත් පෞද්ගලික කාර්යයන්" යන සංරචක "වෙනත් පුද්ගල සේවා කාර්යයන්" ලෙස සඳහන් වේ. 2019 පළමු කාර්තුවට සාපේක්ෂව මෙම කාර්තුවේ දී ඉහත ආර්ථික කටයුත්තෙහි මූර්ත එකතු කළ අගය සියයට 3.4 කින් වර්ධනය වී ඇත.

**ජාතික ගිණුම් අංශය-ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk**

**වෙබ් අඩවිය** www.statistics.gov.lk; http://203.94.94.89/mainsite/NationalAccounts/StaticalInformation